# මියුසියස් විද්‍යාලය

**අධ්‍යයන ලිපි ගොනුව /2වෙනි සතිය මාර්තු /2020**

**10 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය**

**<u>පුවත්පත් විශේෂාංග ලිපි</u> - 10 පාඩම**




**<u>1වෙනි පාඩම</u>**

ජාතික පුවත්පත් කිහිපයක් ගෙන ඔබ කියවීමට කැමති ලිපි කිහිපයක් තෝරා ගන්න.

ඒවා තරමක් දීර්ඝ විය යුතුයි.

**<u>2 වෙනි පාඩම</u>**

ඔබ කියවන ජාතික පුවත්පත්වල ඇති වාර්තා අතුරින් විශේෂාංග ලිපියට හිමිවන්නේ ප්‍රධාන තැනකි. විශේෂාංග ලිපියක් නිර්මාණාත්මක ගුණයෙන් යුක්ත විය යුතුමය. එහි ප්‍රධාන ලක්ෂණයක් වන්නේ පාඨකයා ප්‍රිය කරන මාතෘකාවක් නො ව පාඨකයාට වැදගත්වන මාතෘකාවක් අළලා සම්පාදනය වීමයි.

මේ දිනවලදී ලියන ලද විශේෂාංග ලිපි අතරින් ප්‍රමුඛස්ථානයක් ගනු ලබන්නේ කොරෝනා වයිරසය පිළිබඳවයි. මන්ද එය මහජන සුබසිද්ධිය පිණිස ඉතා වැදගත්වන හෙයිනි.

**<u>විශේෂාංග ලිපියක ලක්ෂණ</u>**

1. නිර්මාණාත්මක හා සමබර ලේඛනයක් විය යුතු ය.

2. එහි අන්තර්ගත කරුණු සම්බන්ධ සෑම පාර්ශවයක් ම ආවරණය විය යුතුයි.

3. අපූර්වත්වයකින් යුක්ත විය යුතුය.

4. තොරතුරු, කරුණු හා දත්ත ආදිය පදනම් කරගෙන පාඨකයාට නව දැනුම ලබා දිය යුතු අතර ඒ සියල්ල නිරවද්‍ය විය යුතුය.

5. විශේෂාංග ලිපිය රචකයාගේ පෞද්ගලික අදහස් හා මතවාද ප්‍රකාශ නො කෙරෙන්නක් මෙන් ම ලේඛකයා සිය සිතැඟි අනුව සම්පාදනය කරන රචනයක් විය යුතුය.

Museus College

6. ඡ යා රූප, ප්‍රකාශ, සංඛ්‍යා දත්ත ආදිය භාවිත කළ හැකිය.

**3 වෙනි පාඩම**

ඔබ මුලින්ම තෝරා ගත් පුවත්පත් ලිපි කිහිපය කියවා ඉහත සඳහන් කරුණුවලට අදාළ විශේෂාංග ලිපි තෝරන්න.

උදා:


මේ වෙනකොට ලක්ෂ නවයක් මධුර ශබ්දකෝෂය බාගත කරගෙන

මධුර කුලතුංග

**4 වෙනි පාඩම**

## පුවත්පත්වල දක්නට ලැබෙන විශේෂාංග ලිපි

1. පුද්ගල චරිත වටා ගෙතුණු විශේෂාංග ලිපි

2. චාරිකා ඇසුරින් ලියැවෙන විශේෂාංග ලිපි

3. යම් නිර්මාණයක් ඇසුරින් ලියැවෙන විශේෂාංග ලිපි

4. විද්‍යාත්මක තොරතුරු ඇසුරින් ලියැවෙන විශේෂාංග ලිපි

5. විචාර විශේෂාංග ලිපි

6. දරුවන්ගේ කුතුහලය දනවන විශේෂාංග ලිපි

Musaeus College

**<u>5 වෙනි පාඩම</u>**

**** විශේෂාංග ලිපි රචනයේ දී අවධානය යොමු කළ යුතු කරුණු 79 වන පිටුවේ ඇතුළත් ය. ඊට අමතරව සම්පූර්ණ පාඩම කියවන්න.**

**වර්තමානයේ දක්නට ලැබෙන විශේෂ කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සාර්ථක විශේෂාංග ලිපියක් ලිවීමට උත්සහ ගන්න.**

**A4 කොළයක් භාවිත කරන්න.**

**(මෙම සටහන නැවත පිටපත් කිරීමට අවශ්‍ය නොවේ. පිටපතක් ගෙන අලවා ගන්න.**

සැකසුම:

නිරෝෂා පෙරේරා මිය

Musaeus College